# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 18 / 2017 (i)**

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2018 මැයි 08 දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**<u>විනයාරක්ෂක II ශ්‍රේණිය සහ I ශ්‍රේණිය තනතුරු දරන්නන් නව බඳවා ගැනීමේ පරිපාටි යටතේ විනයාරක්ෂක තනතුරේ අනුරූප ශ්‍රේණිවලට අන්තර්ග්‍රහණය කිරීම</u>**

2017.09.15 දින සිට ක්‍රියාත්මක 2017.09.12 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 18/2017 හි දක්වා ඇති විනයාරක්ෂක II ශ්‍රේණිය සහ I ශ්‍රේණිය තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටි සමඟ ඉහත කී තනතුරු දෙකෙහි වැටුප් කේතය U-MN 2 සිට U-MN 3 දක්වා වෙනස් වීම කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. කොමිෂන් සභා චක්‍රලේඛ අංක 18/2017 මගින් නව බඳවා ගැනීමේ පරිපාටි නිකුත් කරන ලද කාලයේ දී විශ්වවිද්‍යාල පද්ධතියේ සේවය කරන ලද විනයාරක්ෂක II ශ්‍රේණිය සහ I ශ්‍රේණිය තනතුරු දරන්නන් නව බඳවා ගැනීමේ පරිපාටි යටතේ එම තනතුරුවලටම අන්තර්ග්‍රහණය කිරීමට කොමිෂන් සභාව විසින් 2018.02.01 දින පැවති සිය 980වන සභා වාරයේ දී තීරණය කරන ලදී.

03. කොමිෂන් සභා චක්‍රලේඛ අංක 08/2017 බලාත්මක වූ දිනය වන 2017.09.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි සලකනු ලබන සේවකයාට අදාළ වන පරිදි එම ශ්‍රේණිය යටතේ නව වැටුප් පරිමාණයේ අදාළ වැටුප් පියවරට අන්තර්ග්‍රහණය කරනු ඇත. උදාහරණයක් වශයෙන් සේවකයා U-MN 2 (II) වැටුප් කේතය මගින් දැක්වෙන වැටුප් පරිමාණයේ 03වන පියවරෙහි මාසික වැටුප ලබමින් සිටින්නේ නම් විනයාරක්ෂක තනතුරේ ඔහු විසින් දරන ලද එම ශ්‍රේණියටම U-MN 3 (II) වැටුප් කේතය මගින් දැක්වෙන වැටුප් පරිමාණයේ 03වන පියවර සඳහා ඔහු අන්තර්ග්‍රහණය කරනු ඇත.

| සලකනු ලබන විනයාරක්ෂක II ශ්‍රේණිය සහ I ශ්‍රේණිය තනතුරු දරන්නන්ගේ පෙර වැටුප් පරිමාණ | සලකනු ලබන විනයාරක්ෂක II ශ්‍රේණිය සහ I ශ්‍රේණිය තනතුරු දරන්නන් අන්තර්ග්‍රහණය සඳහා අදාළ වන නව වැටුප් පරිමාණ |
|---|---|
| **විනයාරක්ෂක II ශ්‍රේණිය**<br>U-MN 2 (II) - රු. 37275-18 × 470- මාසිකව 45735 (2020.01.01 දින සිට) | **විනයාරක්ෂක II ශ්‍රේණිය**<br>**U-MN 3 (II) - රු. 42590-18 × 615- මාසිකව 53660 (2020.01.01 දින සිට)** |
| **විනයාරක්ෂක I ශ්‍රේණිය**<br>U-MN 2 (I) - රු. 42590-17 × 615; 8× 690 - මාසිකව 58565 (2020.01.01 දින සිට) | **විනයාරක්ෂක I ශ්‍රේණිය**<br>**U-MN 3 (I) - රු. 49635-9 × 895; 4× 1125 - මාසිකව 62190 (2020.01.01 දින සිට)** |

04. නව වැටුප් පරිමාණ යටතේ සේවකයන් අන්තර්ග්‍රහණය කිරීමත් සමඟ, ඔවුන් හට මූල්‍යමය අලාභයක් සිදු නොවීම සඳහා එවැනි විනයාරක්ෂක තනතුරු දරන්නන් සඳහා හිඟ වැටුප් 2017.09.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගෙවිය යුතුය.

05. කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

**අත්. කළේ / මහාචාර්ය මොහාන් ද සිල්වා**
සභාපති

පිටපත්:

1. ලේකම් / උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ *ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. ආයතන/මණ්ඩපවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන්/ සහකාර ලේඛකාධිකාරිවරුන්
12. ආයතන/මණ්ඩපවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන්/ සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල නියෝජ්‍ය අභ්‍යන්තර විගණකවරුන් /ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්/ සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

ලිපි ගොනු අංකය : යූජීසී /එච්ආර්/ 2/3/79 (වෙළුම -II)

ටී /-